# රඟ මඬල

කලාභූෂණ ගත්කතුවර. සංගීතඥ ශ්‍රී ලංකා ගුවන් විදුලි සේවයේ විශිෂ්ඨ ශ්‍රේණියේ ගායන හා වාද්‍ය ශිල්පී

**ලයනල් ගුණතිලක ලියයි**



**ශ්‍රී ලංකාවේ ටවර් හොල් යුගයේ, එනම් වර්ෂ 1911 සිට සිංහල නූර්ති නාට්‍ය කලාව පෝෂණය කළ නාට්‍යකරුවන්, සංගීතඥයින් හා නළු නිළියන්ගේ අප්‍රකට අනගි තොරතුරු අන්තර්ගත ලිපි මාලාවක පළමුවැන්න**

## ජාතිකාභිමානය නැංවූ කලාකරුවා

## බී.එල්.බෝධිපාල, හෙවත් බටුගෙදර අප්පුහාමිලාගේ ලත්සිංහ බෝධිපාල

මෙම ක්ෂේත්‍රය පිළිබඳව අතීත ආවර්ජනයක යෙදීමේදී නෘත්‍ය හෙවත් නූර්ති නාට්‍ය වංශයේ පුරෝගාමීන් වශයෙන් සලකනු ලබන සී.දොන් බස්තියන් ජයවීර බණ්ඩාර සූරීන්, නීතීඥ ජෝන් ද සිල්වා සූරීන්, නීතීඥ චාල්ස් ඩයස් අමරතුංග සූරීන් යනාදී කතුවරුන් පිළිබඳ කිසියම් දැනීමක් අවබෝධයක් නව පරපුරට තිබෙන බව උපකල්පනය කළ හැකිය. එහෙත් එම ක්ෂේත්‍රය පෝෂණය කළ තවත් එවැනිම කතුවරුන් රාශියක් සිටි බව ඓතිහාසික තොරතුරු මඟින් මනාව ස්ඵුට වේ.

එම කතුවරුන් විසින් ජාතියේ උන්නතිය සඳහා කරන ලද අති විශිෂ්ට සේවාන් ගැන වත්මන් පරපුරේ දැනීම ඉතා අල්පය. එම කතුවරුන් අතරින් සුවිශේෂ නාටක ගණනාවක් රචනා කර ඇති බී.එල්.බෝධිපාල, හෙවත් බටුගෙදර අප්පුහාමිලාගේ ලත්සිංහ බෝධිපාල සූරීන්ගෙන් ජාතියට සිදුවූ විපුල සේවය මෙම ලිපියෙන් විග්‍රහ කිරීම අපගේ ප්‍රයත්නයකි. මෙතුමන් විසින් 19 වැනි සියවසේ අගභාගයේදී ඇතැම් සිංහලයින් යුරෝපීය බටහිර සංස්කෘතිය වැළඳ ගැනීම නිසාම සිදුවන ජාතික පරිහානිය විදහා දක්වමින් එම සංකර පර සිරිත් වලට පහර පිට පහර ගසමින් කළ රචනා වියතුන්ගේ පැසසුමට ලක් වූහ. ඒ තුළින් ජනතාව අවධි කළේය.

එම අමනෝඥයින් යහමගට යොමුකිරීම පිණිස හරවත් සාරගර්භ ගීත රචනා කර එම ගීත එකල සිටි ප්‍රසිද්ධ ගායකයින් ලවා ගායනය කරවා ග්‍රැමෆෝන් තැටි ඔස්සේ ප්‍රචාරය කිරීමත් මෙතුමාගේ සත්ව්‍යාපාරයේ තවත් අගනා මෙහෙවරකි. සිය ජාතියේ ශ්‍රේෂ්ඨත්වය දේශභක්තිය මෙන්ම බුදුදහමේ උන්නතිය නඟා සිටුවීමේ දෘඩතර අධිෂ්ඨානයෙන් යුතු සාරගර්භ රචනා සඳහා මෙතුමන්ගේ අගනා පන්හිඳ හෙවත් පෑන මෙහෙය වූයේ අභීතවය. එනිසාම බුද්ධිමත් ගීත රචකයෙකු, කවියෙකු, නාට්‍ය රචකයෙකු ලෙස ජන තුඩ තුඩ රැඳී ජනාදරයට පාත්‍ර විය.

වර්ෂ 1853 දී රත්නපුර නගරයට ආසන්න සුන්දර ගම්පියසේ ජන්මලාභය ලත් මෙතුමා සිංහල සංස් කෘත, ඉංග්‍රීසි භාෂාවන් පිළිබඳ නිපුණයෙකි. සිය අධ්‍යාපනය නිම කළ පසු කොළඹ, පිටකොටුවේ 'දොන් අමාරිස් සමාගමේ' ලිපිකරුවෙකු ලෙස සේවය කර තිබේ.

1914 සැප්තැම්බර් මස දී පාඨශාලාචාරිනී හඳපා-න්ගොඩ මිසිනෝනා අමරසිංහ මෙනෙවිය සමඟ විවාහ විය.

මෙම යුවල විසින් නන්දාරත්න, උපනන්ද, චන්ද්‍රසේන, තිලකා හා ජයන්තා නමින් දූදරුවන් පස් දෙනකු ජාතියට තිළිණ කර ඇත. ප්‍රවීණ ප්‍රකට කවියෙකු වූ 'උපනන්ද බටුගෙදර' සූරීන් මෙතුමාගේ එක් පුත්‍ර රත්නයකි.



1905 සිට 1912 දක්වා කාලවකවානුව තුල නීතීඥ ජෝන්ද සිල්වා සූරීන්ගේ සිංහල ආර්‍ය සුබෝධ නාට්‍ය සභාවේ හා, ජේ.පීටර් සිල්වා සූරීන්ගේ විපුල ජනරංග සභාවේත් (1918-1922) ටවර් හෝල්හි ආර්‍ය සිංහල නාට්‍ය සභාවේත් (1924-1930) නාට්‍ය කතුවරයෙකු වශයෙන් ඉමහත් සේවයක් කර තිබේ. මෙතුමන් විසින් රචනා කර ඇති නාට්‍ය

1903 'කල්‍යාණවතී' 1908 'සිංහබා' සහ 'මහිලා' 1919 'කනිෂ්ක චක්‍රවර්තී චරිතය' එම වර්ෂයේම 'මහා විජයබාහු චරිතය' 1920, 'කුවේණි චරිතය' 1920 'සංසාර චක්‍රය' 1922 'මනෝහරා' 1921 'මාලවිකා' එම වර්ෂයේම 'පද්මනාථ' 1924 ලලිතා. 1925 සුවිනීත භාර්‍යා, 1926 දුෂ්ඨ නීතීඥයා, 1928 ශ්‍රී දේව, 1929 ඝෝෂක, යන නාට්‍ය සමූහය මෙතුමන්ගේ අනගි රචනාවන්ය.

මෙතුමා වර්ෂ 1931 මාර්තු මස 7 වැනි දින කොළඹ මරදානේ පංචිකාවත්ත පාරේ 'වියානා' හෝටලයේ පිහිටි ස්වකීය ලැගුම් කාමරයේදී ඇති වූ හදිසි හෘදයාබාධයකින් පරලෝ සැපත් විය.

මෙතුමන් විසින් රචිත ගීත ඇතුලු තවත් විස්තරයක් ඊළඟ ලිපියෙන් බලාපොරොත්තු වන්න.

මෙම ලිපිය සකස් කිරීමේදී ආර්.ඇම්.ඒ. රත්නායක මහතාගේ 'ශ්‍රී ලංකාවේ නාට්‍ය කතුවරු (1875-1950) යන කෘතිය බෙහෙවින් උපකාර වූ බව ගෞරවයෙන් සඳහන් කරමි.

Dias Maths
M. Sc Mathematics (USA)
M. Sc Computer Science
B. Sc Mathematics
Mathematics
Grades 6 / 7 / 8 / 9 / 10
VCE – General Maths /
Maths Methods / Specialist Maths
0431 182 632
keerthicnc@yahoo.com
Home visiting
www.facebook.com/DiasMaths

FOR ALL YOUR TRANSLATIONS
PROFESSIONAL TRANSLATOR
NAATI accredited (Level 3)
( ENGLISH SINHALESE)
Documents for immigration purposes
• BIRTH , MARRIAGE, DEATH
• EDUCATIONAL/ VOCATIONAL
• LEGAL and POLICE DOCUMENTS
• NATIONAL IDENTITY CARDS
CONTACT
DR. PREMA KUDALIGAMA
( BA, PGDE, M.A. Ph.D (Edu.)
NAATI Level 3 (Interpreting & Translating)
Tel:(03) 94671658 mob: 0458 60 60 66
Email: premaku@bigpond.com